# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2035/26 - 2017 සැප්තැම්බර් මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2017.09.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ යොමු අංකය* : PLDS/LND/04/ACQ/23.
*ඔබේ අංකය* : 4-3/15/2015/VE/211.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතා ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශ්‍යතාවයේ විස්තර:*

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නවදුන් කෝරළයේ උඩ පත්තුවේ සුළු කොට්ඨාස අංක 167 බී, ඉහළ බෝපිටිය (අ.ග.පී. 197) ගමේ පිහිටි රත්නපුර දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද අ.ග.පි. 197, අතිරේක අංක 20 පත්‍ර අංක 22 හි පහත විස්තර දැක්වෙන ඉඩම් කැබලි;

01. **කැබලි අංක 444**

ඉඩමේ නම: රිල්හේන වත්ත; හිමිකම් කියන්නන්: සීමාසහිත කහවත්ත වැවිලි සමාගම (බදු අයිතිය) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව (ඉඩමේ අයිතිය); ඉඩම් පරිහරණය: අදාළ පුද්ගලයින් හට ඉඩම් කොටස් බෙද දී ඇත. ඒ අනුව නිවාස ඉදි කෙරෙමින් පවතී; ප්‍රමාණය: හෙක්. 1.2141.

*උතුරට* : කැබලි අංක 173ඒ සහ 445; *නැගෙනහිරට* : කැබලි අංක 445; *දකුණට* : කැබලි අංක 177 සහ 173බී; *බටහිරට* : කැබලි අංක 177 සහ 173බී.

ඉහත සඳහන් ඉඩමට /පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම -හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 ඔක්තෝබර් මස 25 වැනි දින පෙ.ව. 10.00 ට පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ වියයුතුය.

තවද 2017 ඔක්තෝබර් මස 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හෝ ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

එච්. සී. එන්. ධර්මපාල
ඉඩම් අත්කරගැනීමේ නිලධාරී
ප්‍රාදේශීය ලේකම්,
පැල්මඩුල්ල.

2017 සැප්තැම්බර් මස 06 වැනි දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 528


1A - G 26210 - 47 (2017/09)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශ්‍යතාවයේ විස්තර:*

ගාල්ල දිස්ත්‍රික්කයේ, නෙළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 232 නෙළුව ග්‍රාම නිලධාරී වසමේ නෙළුව ගමේ පිහිටි, අ.ග.පි. 479 දරන අවසාන පිඹුරේ (අතිරේක අංක 30) ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1316ක් වන පහත සඳහන් ඉඩම් කැබලි;

1. **කැබලි අංක 367**
ඉඩමේ නම: ඕමුල්ලෙගොඩැල්ල; විස්තරය: විවෘත මුඩුබිම; ප්‍රමාණය: හෙක්. 0.0043.

2. **කැබලි අංක 368**
ඉඩමේ නම: ඕමුල්ලෙගොඩැල්ල; විස්තරය: විවෘත මුඩුබිම; ප්‍රමාණය: හෙක්. 0.0362.

3. **කැබලි අංක 369**
ඉඩමේ නම: ඕමුල්ලෙගොඩැල්ල; විස්තරය: විවෘත මුඩුබිම; ප්‍රමාණය: හෙක්. 0.0202.

4. **කැබලි අංක 370**
ඉඩමේ නම: ඕමුල්ලෙගොඩැල්ල/පන්සලේ වත්ත; විස්තරය: විවෘත මුඩුබිම; ප්‍රමාණය: හෙක්. 0.0100.

5. **කැබලි අංක 371**
ඉඩමේ නම: ඕමුල්ලෙගොඩැල්ල/පන්සලේ වත්ත; විස්තරය: විවෘත මුඩුබිම; ප්‍රමාණය: හෙක්. 0.0144.

6. **කැබලි අංක 372**
ඉඩමේ නම: ඕමුල්ලෙගොඩැල්ල/පන්සලේ වත්ත; විස්තරය: විවෘත මුඩුබිම; ප්‍රමාණය: හෙක්. 0.0465.

ඉහත සඳහන් ඉඩමට /පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2017 නොවැම්බර් මස 15 වැනි දින පෙ.ව. 10.00 ට නෙළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තවද 2017 නොවැම්බර් මස 01 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

සී. බී. කේ. ජානක ගුරුසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
නෙළුව.

2017 ක් වූ අගෝස්තු මස 29 වැනි දින
පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 529.

---

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

දෙහි/2-1/අත්/743A/A -01 (21)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1816/23 හා 2013.06.26 දිනැති *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දුටුගැමුණු ගමේ පිහිටි අංක 9288 හා 2013.03.13 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 21 සංශෝධනය මෙසේය.

1. **කැබලි අංක 21**
ඉඩමේ නම: වරි. අංක 139, දුටුගැමුණු වීදිය; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: පී. රන්ජන්, අංක 139, දුටුගැමුණු වීදිය, කොහුවල; ප්‍රමාණය: හෙක්. 0.0214.

නලිනි බාලසුබ්‍රමනියම්,
ප්‍රාදේශීය ලේකම්,
දෙහිවල.

2017 ක් වූ අගෝස්තු මස 29 වැනි දින
දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

09 - 530.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.